## 'සියබස්ලකර' කතුවරයාගේ ස්වාධීනත්වය පිළිබඳ විමර්ශනයක්

ඩබ්. රමණී[1]

අනුරාධපුර පද්‍ය සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී සුවිශේෂ ගෞරවයක් හිමිවන 'සියබස්ලකර' කෘතිය වූකලී කාව්‍යකරණයට උපදෙස් දීම සඳහා සිංහල භාෂාවෙන් රචිත දැනට විද්‍යමාන පැරැණිතම අලංකාර ග්‍රන්ථය යි. අනුරාධපුර පාලන සමයයෙහි රජ කළ සේන රජතුමා (ක්‍රි.ව. 826-846) අමරගිරි කසුබුතුමාගේ ආරාධනය පරිදි "දණ්ඩීන්" විසින් සංස්කෘත අලංකාර ශාස්ත්‍රය පිළිබඳ ලියන ලද "කාව්‍යාදර්ශය" මූලාශ්‍රයය කොටගනිමින් 'සියබස්ලකර' කෘතිය රචනා කළේ ය. සංස්කෘත අලංකාර ග්‍රන්ථයක් මූලාශ්‍රයය කොටගත් පමණින් සියබස්ලකර කෘතිය හුදෙක් ම එහි පදානුපදික පරිවර්තනයක් වේ ද? යන්න පිළිබඳ විමර්ශනයක යෙදීම මේ අධ්‍යයනයෙහි අරමුණ යි. සියබස්ලකර පිළිබඳ කරන ලද අධ්‍යයන්හි සුළු වශයෙන් මේ පිළිබඳ තොරතුරු හමු වුව ද පුළුල් අධ්‍යයනයක් මෙතෙක් සිදු වී නොමැත. මෙහි දී 'සියබස්ලකර' හා 'කාව්‍යාදර්ශය' පිළිබඳ සංසන්දනාත්මක විමර්ශනයක යෙදීමෙන් හා මේ කෘතිය පිළිබඳ ලියවී ඇති ශාස්ත්‍රීය ලිපි ලේඛන ඇසුරු කිරීමෙන් මේ අධ්‍යයනය කෙරිණි. සියබස්ලකරේ අන්තර්ගතය ඇසුරින් පමණක් නො ව ග්‍රන්ථ නාමය මඟින් ද කතුවරයාගේ ස්වාධීනත්වය තහවුරු වේ. මෙහි දී කතුවරයා සිංහල කාව්‍යකරණයට නො ගැළපෙතැ යි සිතූ අවස්ථා එක හෙළා බැහැර කර ඇති අතර ස්වාධීන නිර්මාණයන් එක් කර තිබේ. එසේ ම 'කාව්‍යාදර්ශයේ' දක්නට ඇති දෝෂ පෙන්වා දෙමින් ඒ දෝෂ මඟහරවාගැනීමට උපදෙස් සපයමින් 'සියබස්ලකර' රචනා කර ඇත. මේ නිසා 'සියබස්ලකර' හුදෙක් 'කාව්‍යාදර්ශයේ' පදානුපදික පරිවර්තනයක් ම නො වන බවත් ස්වාධීන ලක්ෂණ ප්‍රකට වන කෘතියක් බවත් මේ අධ්‍යයනය මඟින් තහවුරු කෙරේ.

**ප්‍රමුඛ පද:** දණ්ඩීන්, කාව්‍යාදර්ශය, සියබස්ලකර, සංස්කෘත අලංකාර, පදානුපදික පරිවර්තන

[1] සිංහල අධ්‍යයනාංශය